www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

*ආසියානු සුනාමි ව්‍යසනය: ඓතිහාසික හා දේශපාලන ප්‍රශ්න*

# සසප/ලෝසවෙඅ ප්‍රසිද්ධ රැස්වීමක්, ශ්‍රී ලංකාවේ දකුනේ අගනගරය වන ගාල්ලේ දී

**Asian tsunami disaster: the historical and political issues**

***SEP/WSWS public meeting in Galle, capital of southern Sri Lanka***

**2005 මැයි 17**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප), සුනාමි ව්‍යසනය මගින් මතු කෙරෙන ඓතිහාසික හා දේශපාලන ප්‍රශ්න සාකච්ඡා කරනු පිනිස, දකුනු පලාතේ අගනුවර ද දෙසැම්බර් 26 සුනාමියෙන් දරුනු ලෙස විපතට පත් නගරයක් ද වන ගාල්ලේ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වයි.

සුනාමිය දකුනු ආසියාව පුරා ජීවිතවලට, දේපොලවලට හා පොදු කාර්ය ව්‍යුහයට දැවැන්ත විනාශයක් ගෙන ඒමෙන් පසුව දැන් මාස පහකට ආසන්න කාලයක් ගත වී ඇත. එහෙත් එයින් දිවි ගලවා ගත් දස දහස් සංඛ්‍යාත ජනයා තවමත් ජීවත් වන්නේ, සිය අනාගතය පිලිබඳව කිසිදු නිශ්චිත භාවයකින් තොරව අතිශය කාලකන්නි කොන්දේසි යටතේ ය. ශ්‍රී ලංකාවේ තාවකාලික මඩු කුඩාරම්වල ජීවත් වන අය දැන් වර්ෂා සෘතුව හමුවේ වඩාත් දරුනු ආපදාවන්ට මුහුන දී සිටී. එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව විසින් දෙන ලද විවිධාකාර පොරොන්දු හිස් වචන බව ඔප්පු වී තිබේ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, සුනාමියෙන් විපතට පත් මහජනයා අතර ආන්ඩුව සහ සෙසු දේශපාලන පක්ෂ කෙරෙහි වෛරය වැඩෙමින් පවතී. අත්‍යවශ්‍ය සහනාධාර සහ ප්‍රතිනිර්මාන පහසුකම් සපයනවා වෙනුවට ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූව යෙදී සිටින්නේ වර්ගවාදී ආතතීන් අවුලුවාලීමෙහි ය. එපමනක් නොව, ප්‍රධාන ලෝක බලවතුන් ඇතුලු ජාත්‍යන්තර ආධාර දෙන රටවල් හා ආයතන, ආධාර ලෙස එක්සත් ජනපද ඩොලර් බිලියන 1.8ක් "පොරොන්දු" වී ඇති නමුත් එයින් නිශ්චිතව තහවුරු කොට ඇත්තේ ඩොලර් මිලියන 750ක් පමනි. එම මුදල වත් තවමත් සපයා නැත.

තමන්ගේ ම මූල්‍ය හා මූලෝපායික අවශ්‍යතා සහතික කරගනු වස්, එක්සත් ජනපදය සහ සෙසු බලවත්තු ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගට බල කරන්නේ, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග ඒකාබද්ධ ආධාර යාන්ත්‍රනයක් සඳහා ගිවිසුමක් අත්සන් කරන ලෙසයි. මෙහි එල්ලය වන්නේ, දශක දෙකක සිවිල් යුද්ධය අවසන් කිරීමේ සාකච්ඡා යලි ඇරඹීම සඳහා කොන්දේසි නිර්මානය කර ගැනීමයි. කෙසේවෙතත්, කුමාරතුංගගේ ප්‍රධාන සහාග හවුල්කරු වන සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), එවන් ගිවිසුමක් එල්ටීටීඊයට ජාත්‍යන්තර "පිලිගැනීමක්" සපයනු ඇතැයි කියාපාමින්, මොන යම් හෝ ගිවිසුමකට තදබල ලෙස විරුද්ධව සිටී. කුමාරතුංග එල්ටීටීඊය සමග එකගතාවකට එලඹිය යුතු යයි ඉල්ලා තිබුනු ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂය, දැන් ජවිපෙ සිංහල ස්වෝත්තමවාදයට තමන් ම අනුගත වී ගෙන, ඒ සම්බන්ධයෙන් පස්ස ගසා ඇත.

සුනාමි ව්‍යසනයත් එයින් අනතුරුව පවත්නා තත්වයත් මගින් යලිත් ප්‍රදර්ශනය කෙරී ඇත්තේ, සාමාන්‍ය වැඩ කරන ජනයා මුහුන දෙන මොන යම් හෝ අති මහත් සමාජ හා ආර්ථික ගැටලුවකට අවධානය යොමු කිරිමෙහි ලා හෝ ඒවා විසඳාලීමෙහි ලා ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතයෙහි පවත්නා පරිපූර්න නොහැකියාවයි. ගාල්ලෙහි පැවැත්වෙන සසප/ලෝක සමාජවාදී වෙබ් අඩවියේ රැස්වීම, වත්මන් අර්බුදයෙහි දේශපාලන හා ඓතිහාසික පසුබිම සමාලෝචනය කොට දරිද්‍රතාවට, සමාජ අසමානතාවට හා යුද්ධයට සමාජවාදී විකල්පයක් ඉදිරිපත් කරනු ඇත.

සසප මධ්‍යම කාරක සභික හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික කේ. රත්නායක රැස්වීමේ ප්‍රධාන වාර්තාව ඉදිරිපත් කරනු ඇත.

**දිනය හා වේලාව: මැයි 22 දා සවස 4.00**

**ස්ථානය: සමූපකාර මධ්‍යස්ථානය, පෙට්ටිගලවත්ත, ගාල්ල.**

© www.wsws.org